NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**7 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව** | **ඒකකය : 3 ශ්‍රී ලංකාවේ භූ දර්ශනය**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර,
1) 65610 2) 56610 3) 67610 4) 69510

(2) මධ්‍යම කඳුකරයේ භූ විෂමතා ලක්ෂණයකි.
1) දූපත් 2) කලපු 3) සානු 4) බොක්කු

(3) බලකඩුව දුර්ගය පිහිටා ඇත්තේ,
1) කොළඹ – මහනුවර මාර්ගයේය. 2) කුරුණෑගල – මහනුවර මාර්ගයේය.
3) මාතලේ – මහනුවර මාර්ගයේය. 4) බලංගොඩ – බණ්ඩාරවෙල මාර්ගයේය.

(4) වියළි කලාපීය භූ දර්ශනයට අයත් නගරයක් නොවන්නේ,
1) පොතුවිල් 2) කළුතර 3) අම්පාර 4) යාපනය

(5) පිහිටීම අනුව පුරාණයේ සිටම ආරක්ෂක බලකොටුවක් ලෙස ප්‍රකට ශේෂ කන්දකි.
1) රිටිගල 2) සීගිරිය 3) පිදුරුතලාගල 4) රාගල

(6) වලවේ ගඟට සම්බන්ධ ජලාශයකි,
1) ලුණුගම්වෙහෙර ජලාශය 2) උඩවලවේ ජලාශය
3) රාජාංගන ජලාශය 4) මාදුරු ඔය ජලාශය

(7) පොකුරු (cluster) ජනාවාස දැකිය හැක්කේ,
1) වියළි කලාපයේ ය. 2) අර්ධ ශුෂ්ක කලාපයේ ය.
3) තෙත් කලාපයේ ය. 4) ඉහත සියල්ලෙහිම.

(8) නිදහස් වෙළඳ කලාපයකි.
1) රත්මලාන 2) ඒකල 3) බියගම 4) මාතර

(9) නකල්ස් හා පිදුරුතලාගල කඳුපන්ති අතර පිහිටි සානුවකි.
1) හැටන් 2) වැලිමඩ 3) මහනුවර 4) මහවලතැන්න

(10) යාපන අර්ධද්වීපය හා යාබඳ දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ දැකිය හැකි හස්ත කර්මාන්තයකි.
1) බීරලු හා රේන්ද කර්මාන්තය 2) තල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය
3) වෙස්මුහුණු කර්මාන්තය 4) ලී කැටයම් කර්මාන්තය

- **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.**

(11) ශ්‍රී ලංකාව ඒකීය භූ දර්ශනයක් ඇති රටකි ( )

(12) වියළි කලාපය තුල සැලසුම්කරණ ලද ගොවි ජනපද දක්නට ඇත. ( )

(13) යාපන අර්ධද්වීපයේ කෘෂි කාර්මික කටයුතු සඳහා අහස් දිය යොදා ගනී. ( )

(14) පාසි කුඩා ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ ආශ්‍රිතව පිහිටා ඇත. ( )

(15) ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරය කොළඹ වේ. ( )

- **කෙටි පිළිතුරු ලියන්න.**

(16) කායික හා මානසික සහනය සලසන සුවදායි භූ දර්ශනය කුමක් ද?

..........................................................................................................................................

(17) වියළි කලාපයේ වර්ෂාව මත පදනම් වූ වගාව කුමක් ද?

..........................................................................................................................................

(18) ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රධාන කුරුලු අභය භූමිය කුමක් ද?

..........................................................................................................................................

(19) භෞතික සාධක වලට වඩා මානව සාධක පදනම් කරගෙන නාගරික ජනාවාස වර්ධනය වී ඇති භූ දර්ශනය කුමක් ද?

..........................................................................................................................................

(20) වෙරළ තීරයේ දක්නට ලැබෙන සුවිශේෂ ශාක විශේෂයක් වන්නේ කුමක් ද?

..........................................................................................................................................

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) a) මධ්‍යම කඳුකර භූ දර්ශනයේ දක්නට ලැබෙන ප්‍රධාන කඳු දෙකක් නම් කරන්න.

1) ............................................................... 2) ...............................................................

b) • කඳුකර ප්‍රදේශවල ගස් උසින් අඩු වීමට හේතුව කුමක් ද?

..........................................................................................................................................

• කඳුකර ප්‍රදේශවල එක් පැත්තක තෘණ බිම් තිබීමට හේතුව කුමක් ද?

..........................................................................................................................................

c) කඳුකර භූ දර්ශනයේ වාණිජ පදනමකින් කෙරෙන මානුෂ ක්‍රියාකාරකම් තුනක් ලියා එකක් විස්තර කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(2) a) ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය දැකිය හැකි දිස්ත්‍රික්ක 2 ක් නම් කරන්න.

1) .................................................................. 2) ..................................................................

b) එම කලාපයේ භෞතික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න.

1) .................................................................. 2) ..................................................................

3) .................................................................. 4) ..................................................................

c) වියළි කලාපයේ කැපී පෙනෙන මානව ක්‍රියාකාරකම් දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න.

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

(3) a) ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයේ කැපී පෙනෙන භූ ලක්ෂණ දෙකක් නම් කරන්න.

1) .................................................................. 2) ..................................................................

b) යාපන අර්ධද්වීපයේ හා යාබද දූපත්වල වෙසෙන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායන් හතරක් ලියා දක්වන්න.

1) .................................................................. 2) ..................................................................

3) .................................................................. 4) ..................................................................

c) ''තල් ගස යාපන අර්ධද්වීපයේ ජනතාවට ප්‍රයෝජනවත් ගසකි.'' තල් ගසින් ලබා ගන්නා ප්‍රයෝජන හතරක් ලියන්න.

1) .................................................................. 2) ..................................................................

3) .................................................................. 4) ..................................................................

(4) a) වෙරළ ආශ්‍රිත භූ දර්ශනයේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න.

1) .................................................................. 2) ..................................................................

b) වෙරළාශ්‍රිත පිහිටි සම්පත් පදනම් කරගෙන බිහිවී ඇති කර්මාන්ත හතරක් ලියා දක්වන්න.

1) .................................................................. 2) ..................................................................

3) .................................................................. 4) ..................................................................

c) වෙරළාශ්‍රිත භූ දර්ශනයේ සංචාරක ආකර්ෂණය දිනා ගත් ස්ථාන හතරක් ලියා දක්වන්න.

1) ..................................................................

2) ..................................................................

3) ..................................................................

4) ..................................................................

5) ..................................................................